# වෙළෙඳ,වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යංශය
# ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල

**(1) .** තනතුරු නාමය : සහකාර පර්යේෂක (පුරප්පාඩු - 01)

**(2) .** සේවා ගණය : අධ්‍යයන හා පර්යේෂණ සේවාවන් (AR- 1)

**(3) .** අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද

**බාහිර අයදුම්කරුවන් (පහත I හෝ II)**

අධ්‍යාපන

I විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලනය, ගණකාධිකාරණය, කළමණාකරණය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ග්‍රාමීය සංවර්ධනය යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් සිව් අවුරුදු විශේෂ උපාධිය.

හෝ

II විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලනය, ගණකාධිකරණය, කළමණාකරණය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ග්‍රාමීය සංවර්ධනය යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් සාමාන්‍ය උපාධිය

**සමඟ**

තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයකින් ලබා ගත් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

II. අධ්‍යයන හා පර්යේෂණ කාර්යයන්ට අදාල තනතුරක් දරණ ක්‍රියාත්මක කිරීමේ/උපදේශන" (MA 4) සේවා ගණයෙහි හෝ බලාත්මක කිරීමේ/ක්‍රියාත්මක කිරීමේ/ව්‍යාප්ති නිලධාරි " ( MA 5) සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර අට (08)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**(4) .** වයස

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**(5) .** වැටුප් ක්‍රමය

සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය:

AR - 1 - 2025 රු.91,650-10X2,480-15X3,450-168,200/=

**(6) .** තනතුරට පැවරෙන කාර්යයන්

- අධ්‍යයන හා සංවර්ධන අංශ ප්‍රධානියාගේ මග පෙන්වීම අනුව සමුපකාර හා ව්‍යාපාර ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ උපදේශන සේවා සැපයීම සඳහා පහසුකම් සංවිධානය කිරීම.
- ක්ෂේත්‍ර සමීක්ෂණ මෙහෙයවීම සුපරීක්ෂණය,සමාලෝචනය හා ඇගයීම.
- පර්යේෂණ සඳහා දත්ත අවශ්‍යතා කලමනාකරණය කර ගැනීම.
- සමුපකාර සමිතිවල කළමනාකරණය සංවර්ධනය කිරීම සඳහා අංශ ප්‍රධානි,ජ්‍යෙෂ්ඨ පර්යේෂක නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ පර්යේෂණ,සමීක්ෂණ හා අධ්‍යයන කාර්යයන් සංවිධානය කිරීම.
- වෙනත් අංශ සම්බන්ධිකරණය කර ගනිමින් පර්යේෂණ වැඩසටහන් සහ අනෙකුත් කාර්යයන් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම.
- ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ මගපෙන්වීම අනුව පර්යේෂණ ආයතන,අනෙකුත් ජාතික සහ ජාත්‍යන්තර පර්යේෂණ සංවිධාන සමඟ ඒකාබද්ධව ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.

**(7).** බඳවා ගැනීමේ ක්‍රමවේදය

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ප්‍රතිඵල මත තෝරා ගනු ලැබේ.

**(8).** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදි ලකුණු ලබා දිමේ ක්‍රමය

| | | |
|---|---|---|
| I | අධ්‍යාපන සුදුසුකම් (මූලික සුදුසුකම්වලට අතිරේකව) | - ලකුණු 30 |
| II | පර්යේෂණ පළපුරුද්ද | - ලකුණු 10 |
| III | ප්‍රකාශන,පේටන්ට් බලපත්‍ර සහ ප්‍රදානයන් | - ලකුණු 20 |
| IV | විෂය බාහිර ක්‍රියාකාරකම් | - ලකුණු 10 |
| V | පෞරුෂත්වය | - ලකුණු 15 |
| VI | අදාල ක්ෂේත්‍රය පිළිබඳ සාමාන්‍ය දැනුම | - ලකුණු 15 |
| | | ලකුණු **100** |

අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරි (රා/ආ)
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
පොල්ගොල්ල
2026.08.09